**අපි වෙනුවෙන් අපි අරමුදල -2019**

**------------------------------------**

## 1.1 මතය

**------**

අපි වෙනුවෙන් අපි අරමුදල 2019 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2008 අංක 06 දරන අපි වෙනුවෙන් අපි අරමුදල් පනතේ 11(7) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 මතය සඳහා පදනම

**---------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

**------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති,

පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි එලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ එලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

----------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

------------------------------------

### 1.6.1 ලැබිය යුතු මුදල්

-----------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.24,140,263 ක්වූ ලැබිය යුතු සම්ප්‍රේෂණ කුළුණු ආදායමින් තවදුරටත් රු.3,093,853 ක් අයවිය යුතුව පැවැතිණි. | 2020 වර්ෂයේ අදාළ දුරකථන සමාගම් වෙතින් රු.21,526,849 ක මුදලක් අයකරගෙන ඇත. | ගිවිසුම් ප්‍රකාරව හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රණජයපුර නිවාස ව්‍යාපෘතියේ නිවාස ලාභීන් 667 දෙනෙකුගෙන් අයවිය යුතු හිඟ වාරික මුදල රු. 21,028,796 ක් විය. එහි වසරකට වැඩි හිඟ වාරිකවල වටිනාකම රු.5,956,000 ක් වූ අතර වසර දෙකකට වැඩි හිඟ වාරිකවල වටිනාකම රු.6,075,700 ක්ද විය. | දීර්ඝ කාලීන හිඟ මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් කළමනාකරණ මණ්ඩලය දැනුවත් කර උපදෙස් ලබාගැනීමට කටයුතු කෙරේ. | ගිවිසුම් ප්‍රකාරව හිඟ මුදල් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

පහත සදහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2008 අංක 06 දරන අපි වෙනුවෙන් අපි අරමුදල් පනතේ 11(6) වගන්තිය | පනතේ විධිවිධාන ප්‍රකාරව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන සහ විගණකාධිපති වාර්තාව අරමුදල ආරම්භයේ සිට 2018 වර්ෂය දක්වාම පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරි කාල සීමාව තුල සභාගත කිරීමට අවශ්‍ය කටයුතු සිදුකිරීමට නියමිතය. | පනතේ 11(6) වගන්තිය අනුව කටයුතු කල යුතුය. |
| (ආ) | 2016 මාර්තු 31 දිනැති 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි අංක 756 | සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2020 අගෝස්තු 31 දින දක්වාත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | COVID 19 වෛරසය හේතුවෙන් අදාළ කාර්යයන් සිදුකිරීම ප්‍රමාද විය. | චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |

**1.8 මුදල් කළමනාකරණය**

පහත සදහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අරමුදල විසින් මූල්‍ය අවශ්‍යතා පිළිබඳ පූර්ව සැලැසුම් සකසා නොතිබීම හේතුවෙන් 2019 වර්ෂයේ සංශෝධිත ක්‍රියාකාරකම් සඳහා වූ මූල්‍ය අවශ්‍යතා ඉටුකරගැනීමට ස්ථාවර තැම්පතු දෙකක් කල්පිරීමට පෙර ආපසු ගැනීම හේතුවෙන් රු.7,217,101 ක පොළියක් අරමුදලට අහිමිවී තිබුණි. | 2019 වර්ෂයේදී අමතර පූර්ණ හා අර්ධ නිවාස 325 ක් ඉදිකිරීමට ප්‍රතිලාභ ගෙවීම සඳහා කල්පිරීමට පෙර ස්ථාවර තැන්පතු මුදල් නිදහස් කිරීමට සිදුවිය. | මුදල් පුරෝකථනයක් සිදුකර ඒ අනුව වියදම් සැලසුම් කලයුතුය. |
| (ආ) | පුද්ගලික ආයතනයක් වෙත ලබාදී තිබූ හංස බෝට්ටු ව්‍යාපෘතිය ගිවිසුම ප්‍රකාරව කටයුතු නොකිරීම හේතුවෙන් 2019 මැයි මස සිට දෙසැම්බර් දක්වා එම සේවාවේ කටයුතු අරමුදල විසින් අත්හිටුවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලැබීතිබූ ආදායම රු.676,497 ක් විය. එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 27 ක අඩුවීමක් නිරීක්ෂණය විය. | 2020.01.10 දින සිට නැවත ආරම්භ කර අරමුදල වෙත 30% ක්ද අදාළ ආයතනය වෙත 70% ක්ද, ප්‍රතිශතයක් මත පවත්වා ගෙන යනු ලබයි. | ගිවිසුම ප්‍රකාරව මාසික ආදායම් අයකරගැනීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | රණවිරු නිවාස ප්‍රතිලාභ ප්‍රධානය කිරිමේදී උත්සවයක් සඳහා රු.2,794,825 ක් සහ අරමුදලේ ඉටුකල කාර්යයභාරය පුවත්පත් දැන්වීම් මගින් ප්‍රචාරණය කිරීම වෙනුවෙන් රු.860,338 ක වියදම් සමාලෝචිත වර්ෂයේදී අරමුදලින් දරා තිබුණි. | අදහස් දක්වා නොමැත | පනතේ අරමුණු වලට අදාලව වියදම් දැරිය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.169,350,051 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 101,988,572 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 67,361,479 ක පිරිහීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ ආදායම රු. 610,964 කින් ඉහල ගියද ව්‍යාපෘති සංවර්ධන වියදම රු. 60,789,291කින් හා ව්‍යාපෘති මෙහෙයුම් වියදම රු. 5,308,899 කින් ඉහල යාම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

----------------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ වූ රණවිරුවන් 400 කට අර්ධ නිවාස සඳහා ප්‍රතිලාභ ලබාදීම පසුව නිවාස 700 ක් දක්වාද සංශෝධනය වී රු.499,895,970 ක මූල්‍ය ප්‍රතිලාභ ගෙවා තිබුණි. එක් සාමාජිකයකුට දෙවන හා තෙවන වාරිකයද, සාමාජිකයන් 11 දෙනෙකුට තෙවන වාරිකයද සමාලෝචිත වර්ෂයේදී ගෙවා නොතිබුණි. | ඇතැම් ප්‍රතිලාභී රණවිරුවන්ගේ නිවාස ඉදිකිරීම් වල පවතින අකාර්යක්ෂමතාවයන් හේතුවෙන් ලබා දුන් කාලසීමාව තුල ඉදිකිරීම් අවසන් නොකිරීම සිදුවේ. | මනා අධීක්ෂණයකින් හා පසුවිපරම් කිරීම මගින් ඉදිකිරීම් කටයුතු නිමකරවීම සඳහා ප්‍රතිලාභ ලාභීන් උනන්දු කල යුතුය. |
| (ආ) | 2008 අංක 06 දරන අපි වෙනුවෙන් අපි අරමුදල් පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව සන්නද්ධ සේවා සාමාජිකයන් විසින් මූල්‍ය ආයතන වලින් ණය ලබා ගැනීම , එම ණය ගෙවීම සඳහා ආධාර ලබා දීම සඳහා විදිවිධාන සැලැස්වීම, හමුදා සාමාජිකයකු මිය යෑමේදී හෝ සටනේදී හෝ අනාාකාරයක ස්ථිරව ආබාධිතයකු වීමේදී හෝ තුවාල සිදුවීමේදී ණය ආපසු ගෙවනු ලැබීම සහතික කර ගැනීම සඳහා යෝජනා ක්‍රමයක් සකස් කිරීම යන අරමුණු | ඉල්ලුම් කරුවන් 25,000 කට අධික සංඛ්‍යාවක් හඳුනාගෙන ඇත. එතෙක් ක්‍රියාත්මක කරමින් සිටි නිවාස ව්‍යාපෘතීන්ද සමග මතුවන මූල්‍ය දුෂ්කරතාවයන් හේතුවෙන් සිදුකළ නොහැකිවී ඇත. | පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව අරමුදල පිහිටුවීමේ අරමුණු හා පරමාර්ථ ඉටුකිරීම සඳහා කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සමාලෝචිත වර්ෂය තුලදීද ඉටුවී නොතිබුණි. | | |
| (ඇ) | 2008 අංක 06 දරන අපි වෙනුවෙන් අපි අරමුදල් පනතේ 23 වගන්තියේ අර්ථනිරූපනයට අනුව සන්නද්ධ හමුදා සාමාජිකයින් ලෙස පොලිසියේ සාමාජිකයන්ද දක්වා තිබුනද සමාලෝචිත වර්ෂය තුලදීද පොලිස් සාමාජිකයින්ට අරමුදලේ ප්‍රතිලාභ ලැබී නොතිබුණි. | 2020 වර්ෂය තුළ ශ්‍රී ලංකා පොලීසියේ සාමාජිකයන් සඳහාද ප්‍රතිලාභ පිරිනැමීමට අවශ්‍ය මූලික පියවර ගෙන ඇත. | පනතේ 23 වගන්තිය ප්‍රකාරව කටයුතු කල යුතුය. |

**4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16.2 වගන්තිය ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කල යුතු කාර්ය සාධන වාර්තාව අරමුදල විසින් 2020 ජූලි 27 දින ඉදිරිපත්කර තිබුණි. | කාර්යසාධන වාර්ථාව 2020 ජූලි 27 දින විගණනයට ඉදිරිපත්කර ඇත. | පනතේ 16.2 වගන්තිය ප්‍රකාරව කටයුතු කල යුතුය. |

**4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ජේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා සකස්කර තිබූ ක්‍රියාකාරී සැලැස්මේ අවශ්‍ය තොරතුරු ඇතුලත්වී නොතිබුණි. | 2020 වසර සඳහා ඉදිරිපත් කළ ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර නැවත ඉදිරිපත් කරනු ලැබේ. | චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිලියල කල යුතුය. |

## 4.3 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ අරමුදලේ අයවැය ලේඛණය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි. | අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ හා පාලන උපකරණයක් ලෙස යොදා ගැනීමට ඉදිරි කටයුතු කරනු ලැබේ. | අයවැය ලේඛණය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගීකර ගැනීම කල යුතුය. |

## 4.4 තිරසර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2017 අංක 19 දරන ශ්‍රී ලංකා තිරසර සංවර්ධන පනත හා ජනාධිපති ලේකම්ගේ 2018 මාර්තු 16 දිනැති අංක පීඑස්/එස්පී/එස්බී/3/201දරන චක්‍රලේඛය අනුව අරමුදලට අදාල තිරසර සංවර්ධන අරමුණු ,ඉලක්ක හා එම ඉලක්ක මැනීමේ දර්ශක හඳුනාගෙන නොතිබුණි. | අරමුදලේ ව්‍යාපෘතීන් ආරම්භයේ සිටම වාර්ෂික සැලසුම් අනුව ක්‍රියාත්මක කළ බැවින් තිරසර සංවර්ධන පනතට අදාළව අරමුණු කරා ලඟාවීමට අවශ්‍ය ඉලක්ක ලඟා කරගැනීමේ ප්‍රගතිය පිළිබඳ දර්ශක ඇතුලත් කර නොමැති අතර, ව්‍යාපෘතියේ ඉදිරි සැලසුම් තිරසර සංවර්ධන පනතට අනුගත වන පරිදි සකස් කිරීමට කටයුතු කරනු ලැබේ. | පනත හා චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුය. |